# අර්බුදය ජය ගැනීමට කඩිනම් ප්‍රවේශයක්

ජාතික ජන බලවේගය

අර්බුදය ජය ගැනීමට

# කඩිනම් ප්‍රවේශයක්

ජාතික ජන බලවේගය

නිදහසින් පසු ගෙවී ගිය දශක ගණනාවක් තුළ විවිධ ආණ්ඩු අනුගමනය කළ වැරදි ආර්ථික ප්‍රතිපත්ති සහ ඒ මත ගොඩනැගුණු සමාජ දේශපාලන උපායමාර්ග සහ ක්‍රමයෙන් ස්ථාපිත වී ඇති දූෂිත දේශපාලනය විසින් අපේ රටට අත්කර දී ඇති සමාජ ව්‍යසනය තේරුම් ගැනීමට විශාල සංඛ්‍යා ලේඛන හෝ අටුවා ටීකා අවශ්‍ය නැත. සෑම පැය 24ක දීම ඉහළ යා හැකි ආහාර ඇතුළු අනිකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ගණන් සහ ඒවා මිලදී ගැනීමට එක් තැනකින් තවත් තැනකට ඇවිද යන මහජනතාව අපට සාක්ෂි සපයන්නේ අප රටේ ආර්ථික අර්බුදයේ බරපතළකමයි. එම බරපතළකම තේරුම් ගැනීමට වේගයෙන් හීන වී යන විදේශ සංචිත ප්‍රමාණය හෝ රුපියල් බිලියන ගණනක් වන  අයවැය හිඟය හෝ  රුපියල් ට්‍රිලියන ගණනක් වන ණය පිළිබඳ දැනගැනීම අත්‍යවශ්‍ය නොවේ.

පළමු වසරට දරුවකු ඇතුළත් කරගැනීමට දේශපාලනඥයන් හා වෙනත් නිලධාරීන් පසුපස යන දෙමාපියන්ද පාසලට අමතරව උපකාරක පංතිවලට ගාල් වී අකුරු කරන දරුවන්ද සුදුසුකම් ලැබුවත්, උසස් අධ්‍යාපනයට අවස්ථාව නොලත් උසස් පෙළ සමත් දරුවන්ද වසර 13ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ නොකර අතරමග නතර වන දරුවන්ද අපිට කියාපාන්නේ අපේ අධ්‍යාපනයේ අර්බුදයයි.

නිදහස් සෞඛ්‍යය පිළිබඳව කථා කරන රටක තම ආදයමින් 50%කට වඩා පෞද්ගලික සෞඛ්‍යය සඳහා වියදම් කිරීමට සිදු වීමම අපේ රටේ සෞඛ්‍ය ප්‍රතිපත්තියේ සහ එහි ක්‍රියාත්මක වන ආකාරයේ ගැටලුව අපට පෙන්වා දෙයි. වැඩිහිටි දීමනාව

ලබාගැනීමට පැය ගණන් පෝලිමේ සිටින වයසක අම්මලා සහ තාත්තලා මෙන්ම මහමඟ දමායන වයෝවෘද්ධ වැඩිහිටියන්ද අපිට කියාපාන්නේ, අපි මුහුණ දී සිටින සමාජ බේදවාචකයේ දිග පළලයි. දිනෙන් දින පොලීසියට සහ රෝහල්වලට වාර්තා වන ගෘහස්ථ ප්‍රචණ්ඩ සිදුවීම්වලින් අපට පෙන්නුම් කරන්නේ අපේ සාමාන්‍ය ජීවිත කොතරම් අවදානම්කාරීද යන්නයි.

වැඩිදුර ඉගෙන ගැනීමට අවස්ථාවක්, ජීවත්වීම සඳහා උගත්කමට සරිලන රැකියාවක් සොයා ගැනීමට දැරූ උත්සාහයන් අසාර්ථකව කුමන ක්‍රමයකින් හෝ මේ රටෙන් පිටවීමට පාස්පෝට් පෝලිමේ සිටින තරුණ තරුණියන් අපිට පෙන්වා දෙන්නේ, ඔවුන්ගේ ඉච්ඡාභංගත්වය මෙන්ම අපේ අනාගත ඉරණමේ බිහිසුණු බවයි. දිනෙන් දින උග්‍ර වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ගැටලුවලට නිසි විසඳුමක් නොලැබී යාම නිසා කඩා වැටෙන ව්‍යාපාර සහ ණය කන්දට යට වූ එම ව්‍යවසායකයන් අපිට කියා පාන්නේ, ආර්ථික ව්‍යුහයේ කඩාවැටීමයි.

වෙනදා අසන්නට දකින්නට නොලැබුණ තරමේ නායයාම් ගංවතුර ආදී ස්වාභාවික ව්‍යසනයන් මගින් අහිමි වන මිනිස් ජීවිත සහ දේපළ මගින් අපිට කියාපාන්නේ, සංවර්ධනයේ නාමයෙන් ගෙනයන පාරිසරික සංහාරයේ ප්‍රතිඵලයි.

වත්මන් ආණ්ඩුව මෙම සියලු අර්බුද කෝවිඩ් වසංගතය පිට දැමුවත්, ඒවා අපට පෙන්වා දෙන්නේ අපේ සමාජ, දේශපාලන, ආර්ථික සංස්ථාවල දුර්වලතා මිස වසංගතය නිසා අලුතෙන් ඇති වූ අර්බුද නොවන බවයි. ස්වභාවික හෝ හදිසි අර්බුද, ව්‍යසනවලට දරාගත නොහැකි ආර්ථිකයක් සහ සමාජයක් අපට උරුම වී ඇත්තේ අපේ ආර්ථික සහ සමාජයීය ප්‍රතිපත්ති සහ උපායමාර්ගවල තර්කානුකූල ප්‍රතිඵලයක් ලෙසිනි.

අප පමණක් නොව මුළු ලෝකයම පාහේ මෙම තත්වය අත්දකිමින් සිටියි. ලෝකයේ ආර්ථිකය වර්ධනය වැඩි වී ඇතත්, ඒ හා සමානව අසමානතාවයද  වර්ධනය වී ඇත. පෘථිවියට දරා ගත නොහැකි ලෙස එහි පරිසරය විනාශ වී



වැඩිහිටි දීමනාව ලබාගැනීමට පැය ගණන් පෝලිමේ සිටින වයසක අම්මලා සහ තාත්තලා මෙන්ම මහමඟ දමායන වයෝවෘද්ධ වැඩිහිටියන්ද අපිට කියාපාන්නේ අපි මුහුණ දී සිටින සමාජ බේදවාචකයේ දිග පළලයි

ඇත. මේ නිසා ලෝකයම වෙනස් දිසාවකට යොමුවෙමින් පවතී. වඩා සාධාරණ, සානුකම්පික හා මානුෂීය ලෝකයක් අප විසින් ගොඩනගා ගත යුතු බව බොහෝ දෙනා අද විශ්වාස කරති. පහසු කටයුත්තක් නොවුණත්, එම වෙනස කරා පියවර කිහිපයක්වත් තැබිය යුතු බව අපි විශ්වාස කරමු. ලෝකය පුරා එවන් විශ්වාසයක පිබිදීමක් ඇතිවෙමින් පවතී.

පසුබසින්නට මීට වඩා අඟලක් හෝ ඉවසා සිටීමට මීට වඩා මොහොතක් අපිට ඉතිරි වී නැත. තවදුරටත් මේ පාරේම ගමන් කිරීමෙන් අනතුරට හෙළන්නේ ඔබේත් මගේත් ජීවිත පමණක් නොව අපේ දුවා දරුවන් ඇතුළු ඉදිරි පරම්පරා ගණනාවකම ඉරණමයි. මේ මොහොතේ අපේ හෘද සාක්ෂිය අවදි කොට අප ඇසිය යුත්තේ මෙම අවාසනාවන්ත ඉරණම අනාගත පරපුරට අත්වීමට ඉඩ නොදී එය වෙනස් කරලීම සඳහා මේ වැරදි සමාජ ආර්ථික ප්‍රතිපත්තිවල ගැඹුරු හා පුළුල් වෙනසක් වෙනුවෙන් අපි පෙනී සිටිය යුතු බව සහ එම වෙනස අත්පත් කර ගැනීමට සමත් දේශපාලන ව්‍යාපාරයක් සමඟ එකට එකතු විය යුතු බව නොවේද?

ජාතික ජනබලවේගය ලෙස එම ගැඹුරු සහ පුළුල් සමාජ ආර්ථික වෙනස අත්පත් කරගැනීමට අවශ්‍ය අඩිතාලම සඳහා මූලික අදහස් අඩංගු කඩිනම් ප්‍රවේශයක් මෙසේ ඉදිරිපත් කරමු. එම යෝජනා තවදුරටත් පුළුල්කොට ඒවා මේ බිමේ යථාර්ථයක් කරගැනීම සඳහා අප සමඟ අත්වැල් බැඳගන්නා මෙන් ඔබට ආරාධනා කරමු.

ජාතික ජන බලවේගය
2021 දෙසැම්බර්



තවදුරටත් මේ පාරේම ගමන් කිරීමෙන් අනතුරට හෙළන්නේ ඔබේත් මගේත් ජීවිත පමණක් නොව අපේ දුවා දරුවන් ඇතුළු ඉදිරි පරම්පරා ගණනාවකම ඉරණමයි

# අයදින ආර්ථිකයක් වෙනුවට උපයන ආර්ථිකයක්

වත්මන් ආර්ථික අර්බුදය ජනිත වීමට කිසිදු විචාරයකින් තොරව අප රටේ ආණ්ඩු අනුගමනය කළ වැරදි ආර්ථික මූලෝපායන් සහ වංචා, දූෂණ හා නාස්තිය හේතු වී තිබෙන බව ඉතා පැහැදිලිය.

1977 වසරේ දී හඳුන්වාදුන් "විවෘත ආර්ථික ප්‍රතිපත්තිය" සමාජය නොසලකා පෞද්ගලික ලාභයට පමණක් මුල්තැන දෙන විනාශකාරී ප්‍රතිපත්තියකි. කෝවිඩ් වසංගතය හමුවේ පවා සීමිත පිරිසක් විසින් අධික ලාභ ලැබීමට, කොමිස් ගැනීමට, වංචාවේ හා දූෂණයේ යෙදීමට කටයුතු කිරීම මගින් එය සනාථ කරයි. මෙම විනාශකාරී ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා කිහිප දෙනෙකු අත කේන්ද්‍ර කරගත් දේශපාලන බලතන්ත්‍රයක්ද ඒ සමඟම නිර්මාණය කරගන්නා ලදී. ප්‍රජාතන්ත්‍ර විරෝධී මෙම අර්ථ ක්‍රමය අප රටට පමණක් සුවිශේෂ වූවක් නොවූ, එවකට පැවති ලෝක දේශපාලන ආර්ථික ප්‍රවණතාවයක්ද වූ අතර ශ්‍රී ලංකාව පාලනය කළ සෑම ආණ්ඩුවක්ම අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක කරන ලද්දේ එයයි.

උක්ත ආර්ථික ප්‍රතිසංස්කරණවලින් සිදුවූයේ අද මහජනතාව මුහුණදෙන ආර්ථික දුෂ්කරතා නිර්මාණය කළ දරුණු ආර්ථික අර්බුදයේ මූලික අඩිතාලම දැමීමයි. දේශීය නිෂ්පාදනය වැඩිකිරීමට ප්‍රමුඛත්වය දෙනවා වෙනුවට මූල්‍ය වෙළඳපොළ ප්‍රසාරණය කිරීම, රාජ්‍ය සුබසාධන වියදම් සීමා කිරීම, සහනාධාර කපාහැරීම, වෙළඳපොළ ඒකාධිකාරිය බිහිකිරීම, අකාර්යක්ෂම හා අවිධිමත් ණය ලබාගැනීම, මහජන දේපොළ, හා රාජ්‍ය ව්‍යවසායන් විවිධ නම්වලින් පුද්ගලයින් හා සමාගම් අතට පත්කිරීම මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණයක්ය. ක්‍රමිකව විකාශනය වූ මෙම ප්‍රතිපත්තිය නව ලිබරල්වාදය නමින් පසුකාලයේ නාමකරණය විය. එහි ක්‍රියාකාරිත්වය ගෝලීයකරණය නමින් මූල්‍ය ප්‍රාග්ධනයට තම ආධිපත්‍ය පැතිරවීමට ඉඩ සලසමින් භාණ්ඩ නිෂ්පාදනයෙන් විතැන් වුණු

ආර්ථික බුබුළු නිර්මාණය කරන කෘත්‍රිම මූල්‍ය වෙළඳපොළක් ඇති කරන ලදී. එහි දරුණුතම ප්‍රතිවිපාකයක් වන ගෝලීය මූල්‍ය අර්බුදයට 2008 දී ඇමෙරිකා එක්සත් ජනපදයට මුහුණදීමට සිදුවිය. එම අර්බුදය රාජ්‍ය මැදිහත් වීම මගින් තාවකාලික සමනය කළද තවමත් වරින් වර මතු වෙමින් මේ වනවිට ලෝක ආර්ථික අවපාතයක් දක්වා ගමන් කරමින් සිටී.

නිදහසින් පසු, ශ්‍රී ලංකාවේ ආර්ථිකය විකාශනය වී ඇති ආකාරය විශ්ලේෂණය කිරීමෙන් පෙනීයන්නේ ක්‍රමවත් සැලැස්මක් යටතේ පරිසර හිතකාමී, ජනතාවට යහපත් සමාජයක්, ලස්සන ජීවිතයක් අත්පත් කරදීමට සමත් ආකාරයට ආර්ථිකය මෙහෙයවා නැති බවය; ලෝක ආර්ථිකයෙන් සැලකිය යුතු පංගුවක් අත්පත්කර ගැනීමට සමත්වෙනවා වෙනුවට අඩුම තරමින් අතීතයේදී අත්පත් කරගෙන තිබූ ස්ථානයවත් රැකගැනීමට අපොහොසත් වී ඇති බවය. ආර්ථික සංවර්ධන උපායමාර්ගය මත ණය ලබාගන්නවා වෙනුවට තම පටු දේශපාලන වුවමනා සහ පාලකයින්ගේ පුද්ගලික ආර්ථිකමය වාසි මත ඒ ඒ ආණ්ඩු සිදුකළ ණය ලබාගැනීම සහ අසීමාන්තික වංචා දූෂණ හේතුවෙන්, අද වන විට විදේශ ණය ගෙවීමේ හැකියාව අතින් ජාත්‍යන්තර වාර්ගීකරණයන්ට අනුව රාජ්‍යය බංකොලොත් වීමේ සීමාව ආසන්නයට ඇද දමා, රට ණය ගෙවාගැනීමට ප්‍රමාණවත් විදේශ විනිමය නොමැතිව විෂම ණය චක්‍රයක ගොදුරක් බවට පත්කරනු ලැබ ඇත.

අර්බුදය ජය ගැනීමට
**කඩිනම් ප්‍රවේශයක්**

**ලෝක ආර්ථිකයෙන් සැලකිය යුතු පංගුවක් අත්පත්කර ගැනීමට සමත්වෙනවා වෙනුවට අඩුම තරමින් අතීතයේ දී අත්පත් කරගෙන තිබූ ස්ථානයවත් රැකගැනීමට අපොහොසත් වී ඇත**



# අපගේ ප්‍රවේශය

අපි විසින් අනුගමනය කරන්නේ කුමන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කළ යුතුද, කුමන නිෂ්පාදන ක්‍රමවේද අනුගමනය කළ යුතුද, කුමන ආකාරයකට තාක්ෂණය ඒ සඳහා යොදා ගත යුතුද, අප සතු මානව හා භෞතික සම්පත් කුමන ආකාරයකින් උපයෝජනය කළ යුතුද, විදේශ වෙළඳාමේ ව්‍යුහය කෙසේ සකස් විය යුතුද, නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රතිලාභ කෙසේ මහජනතාව අතර බෙදා ගත යුතුද යන කාරණා ඇතුළත් වටිනාකම් එකතු කරන ආර්ථික ප්‍රවේශයක් පමණක්ම නොවේ. මනුෂ්‍යත්වය, සමාජ සාධාරණත්වය, පරිසර හිතකාමීත්වය, ආර්ථික තිරසාරත්වය, ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය සහ සංස්කෘතිය, මහජන සහභාගිත්වය, ප්‍රශස්ත සම්පත් උපයෝජනය හා ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ආදී සියල්ල එකවිට සැලකිල්ලට ගන්නා නව ප්‍රවේශයකි. අපි ඒ බව ප්‍රථමයෙන් අවධාරණය කරමු.

- **ශ්‍රී ලංකාවේ ශක්‍යතාවය මත කෙටි කාලීන, මධ්‍යකාලීන හා දිගු කාලීන වශයෙන් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ආර්ථික සංවර්ධන ඉලක්කයන් ඇතුළත් සංයුක්ත ජාතික සැලැස්මක්**
- **ඉහත සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත සූදානම් කිරීම**
- **රාජ්‍ය හා පෞද්ගලික අංශය තුළින් සෑම පුරවැසියෙකුටම රට ගොඩනැගීමේ සාමූහික කාර්යට උරදීමට අවස්ථාව සැලසීම**
- **නිෂ්පාදන ක්‍රියාවලියේදී ආහාරවල ප්‍රමාණාත්මක බව හා සුරක්ෂිතතාවයට ප්‍රමුඛතාවය**
- **දේශීයව නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ ආනයනය කිරීම අධෛර්යමත් කිරීම**
- **නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නංවාගැනීම සඳහා තාක්ෂණය, නව ක්‍රමවේද, නිර්මාණශීලීත්වය හා නවෝත්පාදන නිෂ්පාදන සෑම ක්ෂේත්‍රයකටම හඳුන්වාදීම**



රාජ්‍ය හා පෞද්ගලික අංශය තුළින් සෑම පුරවැසියෙකුටම රට ගොඩනැගීමේ සාමූහික කාර්යට උරදීමට අවස්ථාව සැලසීම

- ප්‍රධාන සැලසුම් ඉලක්ක ළඟා කරගැනීම සඳහා අවශ්‍ය ආර්ථික වෘද්ධිය ජනනය කරන හා බහුවිධ කර්මාන්ත සහ නව තාක්ෂණය සහිත විදේශ ආයෝජන කැඳවීම
- මූලික නිෂ්පාදන අමුද්‍රව්‍ය ලෙස පමණක් අපනයනය කිරීම වෙනුවට ලෝක වෙළඳපොළ තුළ නිර්මාණය වන ඉල්ලුම් ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් අගය එකතු කළ භාණ්ඩ ලෙස ඒවා අපනයනය කිරීම සහ ගෝලීය සැපයුම් දාමයට සම්බන්ධ වී විදේශ විනිමය වැඩිපුර උත්පාදනය කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම
- අපගේ ශිෂ්ටාචාරය හා නෛසර්ගිකව බැඳී ඇති කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය වැඩබිමේ සිට ජාත්‍යන්තර වෙළඳපොළ දක්වා විහිදුණු ජාලගත ක්‍රමවේදයක් ඔස්සේ නවීකරණයට භාජනය කිරීම
- ලෝක පරිමාණයෙන් සිදුවන දේශගුණික විපර්යාසයන්වල අහිතකර ප්‍රතිඵල ඉවත්කරලීම සඳහා වන ව්‍යාපෘති සඳහා දිගුකාලීන හරිත බැඳුම්කර නිකුත් කිරීම මගින් මූල්‍ය සම්පාදනය කිරීම
- තාක්ෂණික ක්ෂේත්‍රයේ දළ දේශීය නිෂ්පාදිතයේ දායකත්වය හා විදේශ විනිමය ඉපයීම වර්ධනය කර ගැනීම සඳහා ක්ෂේත්‍රයේ නියුතු ආයතන හා වෘත්තිකයින් ප්‍රමාණය වැඩිකරගැනීම, තාක්ෂණික තරගකාරීත්ව දර්ශකය හා පුරවැසි හා රාජ්‍ය ඩිජිටල් සාක්ෂරතාවය ඉහළ නැංවීම
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික පිහිටීම ප්‍රයෝජනයට ගනිමින් එය ප්‍රධාන නාවුක සේවා සැපයීම් මධ්‍යස්ථානයක් බවට පත්කිරීම
- දේශගුණික, භූගෝලීය හා සංස්කෘතික විවිධත්වය මත පදනම් වූ සංචාරක කර්මාන්තයක් ඇතිකිරීම




ශ්‍රී ලංකාවේ ස්වාභාවික පිහිටීම ප්‍රයෝජනයට ගනිමින් එය ප්‍රධාන නාවුක සේවා සැපයීම් මධ්‍යස්ථානයක් බවට පත්කිරීම

# රාජ්‍ය ණය

ජාතික ජනබලවේගයේ ආණ්ඩුවක් යටතේ විදේශ ණය ප්‍රශ්නය විසඳන්නේ කෙසේද යන්න විස්තරාත්මක ලියවිල්ලක් වෙනම ඉදිරිපත් කරන අතර විදේශීය සංචිත වර්ධනය කරගනිමින් ණය ගෙවීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා සාරාංශගත ක්‍රියාමාර්ග පමණක් මෙසේ සටහන් කරමු.

- **ශ්‍රී ලංකාව ණය උගුලේ හිරකළ පාර්ශ්වයන්ට වගකීමෙන් නිදහස්වීමට ඉඩ ලබා නොදෙන අතර විශේෂඥයන්ගෙන් සැදුම්ලත් කොමිසමක් මගින් දැනට ගෙවීමට ඇති සියලු විදේශ ණය පිළිබඳව පූර්ණ විමර්ශනයක් හා විගණනයක් සිදුකිරීම**
- **ඉදිරි වසර 05 ඇතුළත විදේශ විනිමය උපයා ගන්නා ආකාරය දැක්වෙන විධිමත් සැලසුමක් සකස් කිරීම**
- **ණය ආපසු ගෙවීම ප්‍රතිව්‍යුහගත කිරීම හා වෙනත් සහන ලබාගැනීම සඳහා ණය ලබාදුන් ඒ ඒ පාර්ශ්ව සමඟ රාජ්‍යතාන්ත්‍රිකව කටයුතු කිරීම**
- **විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට, ව්‍යාපාරිකයින්ට හා ධනවතුන්ට වැඩි වශයෙන් රටට විදේශ විනිමය ප්‍රේෂණය කිරීමට හා අයෝජන කිරීමට අවශ්‍ය විශ්වාසනීය හා විනිවිදභාවය පෙනෙන නව ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාව තුළ ආරම්භ කිරීමට අවස්ථා ලබාදීම**





**ණය ආපසු ගෙවීම ප්‍රතිව්‍යුහගත කිරීම හා වෙනත් සහන ලබාගැනීම සඳහා ණය ලබාදුන් ඒ ඒ පාර්ශ්ව සමඟ රාජ්‍යතාන්ත්‍රිකව කටයුතු කිරීම**

# නිෂ්පාදන ආයතන ව්‍යුහයන්

විවිධ ව්‍යුහයන් යටතේ දැනට සිදුවන භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලීන් තුළ එකිනෙකා වැඩකරන්නේ තනි ඉලක්ක හා අරමුණු මත බැවින් ස්වාමියා හා සේවකයා අතර හෝ වෙනත් පාර්ශවයන් අතර විවිධ ආකාරයේ ගැටුම් සිදුවෙමින් පවතී. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් යටතේ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීව නිෂ්පාදනය කිරීමට හා බෙදාහැරීමට හැකිවන පරිදි සෑම පාර්ශ්වයකම දැනුවත්භාවය හා එකඟතාවය මත තීරණ ගැනීමටත්, නිෂ්පාදන ක්‍රියාවලිය ඉහළ කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් යුතුව ගැටුම් නොමැතිව සිදුකිරීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කරදෙනු ලැබේ. එමගින් ජාතික නිෂ්පාදනයේ හා කර්මාන්තයේ ස්වභාවය මත ලෝක ප්‍රවණතා ලෙස මතු වී ඇති සාමූහික වගකීම් දරමින් ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගන්නා විවිධ ආයතන ව්‍යුහයන් ධෛර්යමත් කරනු ලැබේ.

- **වෙළඳපොළ තුළ ඇතිවිය හැකි ඒකාධිකාරයන් සහ කතිපයාධිකාරයන් වැළැක්වීම හා නව නිෂ්පාදන ව්‍යුහයන් හඳුන්වාදීම**
- **සුළු හා මධ්‍යම පරිමාණ කෘෂිකර්මය, පශු සම්පත් හා ධීවර ක්ෂේත්‍රය තුළ නිෂ්පාදනය හා බෙදාහැරීම සඳහා ජාලගත ව්‍යුහයන් හඳුන්වාදීම**





ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් යටතේ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදීව නිෂ්පාදනය කිරීමට හා බෙදාහැරීමට හැකි වන පරිදි සෑම පාර්ශ්වයකම දැනුවත්භාවය හා එකඟතාවය මත තීරණ ගැනීම

# වංචා දූෂණ හා නාස්තිය පිටුදැකීම

නව ලිබරල් ආර්ථිකය යනු වංචාව, දූෂණය හා සොරකම අතිනත ගත් දේශපාලන ආර්ථික ක්‍රමයකි. ඇස්පනා පිට මහදවල් මහජන දේපොළ මංකොල්ලකන කිසිවෙකු නීතිය ඉදිරියට පමුණුවා දණ්ඩනයට යටත් කළ නොහැකි වීමෙන් මේ බව මොනවට පැහැදිලිය.

- **මහජන දේපොළ ගසා කෑ මංකොල්ලකරුවන් විධිමත් අධිකරණ ක්‍රියාවලියක් මගින් දණ්ඩනයට යටත් කොට එම දේපොළ මහජන සේවාවන් දියුණු කිරීම සඳහා භාවිත කිරීම**
- **ආණ්ඩුවේ ආර්ථික මෙහෙයුම් ක්‍රියාවලිය ක්‍රමයෙන් පූර්ණ ඊ පාලනයක් දක්වා පරිවර්තනය කිරීම**
- **වංචා දූෂණ පිටු දැකීම හා  මූල්‍ය විනය ආරක්ෂා තරගැනීමට අවශ්‍ය තාක්ෂණය හඳුන්වාදීම**

# සමාජ ආරක්ෂණය

අපේ සමාජය තුළ ජීවත් වන සියලුම පුද්ගලයින් හා ප්‍රජාවන්ට අභිමානවත් ලෙස ජීවත්වීමට අවශ්‍ය මූලික පහසුකම් විශ්වාසනීයත්වයකින් හා සාධාරණව ලැබිය යුතුව තිබේ. පොදුවේ සියලු පුරවැසියන්ටත් විශේෂයෙන් ස්ත්‍රීන්, ළමුන්, වැඩිහිටි, ආබාධිත ප්‍රජාවන්ටත් යහපත් ජීවිතයක් ගෙනයාමට අවශ්‍ය සමාජ ආර්ථික පරිසරයක් ඇතිකරලීම ආණ්ඩුවේ ප්‍රධාන වගකීමකි. එම කාර්යෙහිදී සමාජ ආරක්ෂණය වෙළඳ භාණ්ඩයක් ලෙස නොසලකමින් ජාතික සැලැස්මක් මත පෞද්ගලික අංශයද සහභාගි කරගනිමින් කටයුතු කිරීමට ආණ්ඩුව මූලිකව ක්‍රියාකරනු ඇත.



**පොදුවේ සියලු පුරවැසියන්ටත් විශේෂයෙන් ස්ත්‍රීන්, ළමුන්, වැඩිහිටි, ආබාධිත ප්‍රජාවන්ටත් යහපත් ජීවිතයක් ගෙනයාමට අවශ්‍ය සමාජ ආර්ථික පරිසරයක් ඇතිකරලීම**

අර්බුදය ජය ගැනීමට
කඩිනම් ප්‍රවේශයක්

# අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ සමාජ සංචලනය ප්‍රවර්ධනය කිරීමෙහිලා අධ්‍යාපනය අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සහ බහුත්ව සමාජයකට අවශ්‍ය වටිනාකම් සහිත පුද්ගලයකු බිහි කළ හැක්කේද ගුණාත්මක අධ්‍යාපනයක් තුළිනි. නිදහස් අධ්‍යාපනය අපිට වැදගත් වන්නේ එහෙයිනි. එසේම ආර්ථික හා මානව සම්පත් සංවර්ධනයද අරමුණ කරගනිමින් ගුණාත්මක අධ්‍යාපනය පවත්වාගෙන යාම සඳහා ආණ්ඩුවේ කාර්යභාරය අතිශය වැදගත් වේ.

- **මුල් ළමාවිය සංවර්ධනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා නොමිලේ අධ්‍යාපනය**
- **සෑම පුද්ගලයකුටම කුසලතාවය හා හැකියාව මත අධ්‍යාපනයට ප්‍රවේශවීම සඳහා සාධාරණ අවස්ථාව**
- **විශේෂඥ දැනුම සහ අදාළ දත්ත මත පදනම් වෙමින් අධ්‍යාපනයේ ව්‍යුහාත්මක වෙනසක්**
- **වෙළඳ භාණ්ඩයක් බවට පත්වෙමින් තිබෙන පෞද්ගලික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ අසාධාරණ ගාස්තු නියාමනයට පියවර**
- **රාජ්‍ය හා පුද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල පශ්චාත් උපාධි අධ්‍යාපනය නියාමනයට පියවර**
- **ක්‍රමිකව සහ සැලසුම් සහගතව දළ ජාතික නිෂ්පාදනයෙන් අවම වශයෙන් 6%ක් අධ්‍යාපනයට වෙන් කිරීම**

**මුල් ළමාවිය සංවර්ධනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා නොමිලේ අධ්‍යාපනය**





# සෞඛ්‍යය

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්වචනය කර ඇති ආකාරයට සෞඛ්‍යය යනු රෝගාබාධයෙන් තොරවීම පමණක් නොව පූර්ණ කායික, මානසික සහ සමාජීය සුවතාවය ලැබීමයි. ජනතාවගේ නිරෝගීකම ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීමෙහිලා සහ සමාජ සංවර්ධනයෙහිලා දායකවීම ප්‍රධාන සාධකයකි.

- **සියලු පුරවැසියන්ගේ පුද්ගලික සෞඛ්‍යය නිරන්තර අධීක්ෂණයට ලක්කරමින් අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු කරන සෞඛ්‍ය පද්ධතියක්**
- **ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ආදායම් හෝ සමාජ තත්වය, රැකියා ස්වභාවය යනාදිය මත වෙනස් ලෙස නොසලකා සියලු පුරවැසියන්ට ගුණාත්මක සෞඛ්‍ය සේවයක්**
- **එක් පවුල් ඒකකයක පෞද්ගලික සෞඛ්‍යය සඳහා ආදායමෙන් වෙන් කරන ප්‍රතිශතය සැලසුම් සහගතව අඩු කිරීම සඳහා වැඩපිළිවෙළක්**
- **සෞඛ්‍යය සඳහා දළ ජාතික නිෂ්පාදනයෙන් අවම වශයෙන් 5% ක්**
- **පුරවැසියාගේ සෞඛ්‍යමත් ආයු කාලය වැඩි කිරීමට පියවර**



**එක් පවුල් ඒකකයක පෞද්ගලික සෞඛ්‍යය සඳහා ආදායමෙන් වෙන් කරන ප්‍රතිශතය සැලසුම් සහගතව අඩු කිරීම සඳහා වැඩපිළිවෙළක්**

# සංස්කෘතිය, කලාව හා විනෝදාස්වාදය

සංස්කෘතිය ආර්ථිකයෙන් සාපේක්ෂ ස්වාධීනත්වයක් ඇති අඩවියකි. ඒ අතරම අනික් අතට එය පෙරළා ආර්ථිකයටද බලපෑම් කරනු ලබයි. එහෙයින් සංස්කෘතික මිනිසෙකු බිහිකර ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම ආණ්ඩුවක වගකීමක් ලෙස සලකමු. මෙම කලාපය පොදු ජනතාවට භුක්ති විඳිය නොහැකි ක්ෂේත්‍රයක් බවට අද පත්ව ඇත. ඉතාම වෙහෙසකර ජීවනෝපාය අරගලයෙන් හෙම්බත්ව සිටින පොදු ජනතාවට කලාව, රසාස්වාදය හා විනෝදාස්වාදය සඳහා මැදිහත්වීමටත්, රසඥතාව ඉහළ නංවා ගැනීමටත්, නිර්මාණකරණයෙහි යෙදීමටත් පුළුල් අවකාශයක් සලසනු ඇත. සිනමා, නාට්‍යය, නැටුම්, සංගීත, කාව්‍ය හා නවකතා කෙටිකතා, චිත්‍ර, මූර්ති ශිල්ප, පාරම්පරික කලා ශිල්ප ආදී ක්ෂේත්‍රවල නිර්මාණකරුවන් සමඟ එක්ව සැලසුම් කරන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවේ සහාය නොමඳව ලැබෙනු ඇත.

**ඉතාම වෙහෙසකර ජීවනෝපාය අරගලයෙන් හෙම්බත්ව සිටින පොදු ජනතාවට කලාව, රසාස්වාදය හා විනෝදාස්වාදය සඳහා මැදිහත්වීමටත්, රසඥතාව ඉහළ නංවා ගැනීමටත්, නිර්මාණකරණයෙහි යෙදීමටත් පුළුල් අවකාශයක් සලසනු ඇත**







# ප්‍රවාහනය

මගීන් යනු විවිධ ගමනාගමන අවශ්‍යතා ඇති කණ්ඩායම් ගණනාවක එකතුවක් වන බැවින් (ස්ත්‍රී-පුරුෂ, වැඩිහිටියන්, ළමයින් සහ ආබාධ සහිත පුද්ගලයින්) එම විවිධත්වයට අනුකූළ ගුණාත්මක ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාමට කටයුතු කෙරේ.

- **පරිසර හිතවාදී කාර්යක්ෂම විශ්වාසනීය ආරක්ෂාකාරී ගෞරවාන්විත පොදු ප්‍රවාහන පද්ධතියක් කරා ක්‍රමයෙන් පරිවර්තනය වීම**
- **දශකයක් තුළ ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවන්ගෙන් 80%ක් පොදු ප්‍රවාහන සේවය මගින් සැපයීමට හැකි වන පරිදි පොදු ප්‍රවාහනය ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වර්ධනය කිරීම**
- **විවිධ ප්‍රවාහන මාදිලි (පදික මංතීරු, පාපැදි, ජල වාහක ආදී) ප්‍රවර්ධනය කිරීම**

**දශකයක් තුළ ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවන්ගෙන් 80%ක් පොදු ප්‍රවාහන සේවය මගින් සැපයීමට හැකි වන පරිදි පොදු ප්‍රවාහනය ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වර්ධනය කිරීම**

# ස්ත්‍රීන්

වර්තමාන ශ්‍රී ලාංකේය දේශපාලන සන්දර්භය තුළ මතු වී ඇති අර්බුදකාරී තත්වය හමුවේ ස්ත්‍රීන්ට බලපාන සමාජ-ආර්ථික, සංස්කෘතික, සහ දේශපාලනික ගැටලු ශ්‍රී ලාංකේය දේශපාලන සංවාදයේ කේන්ද්‍රීය අවධානයට යොමු කිරීම අපගේ මූලික අභිප්‍රායයි. සමාජය තුළ ස්ත්‍රිය ප්‍රධාන සමාජ-ආර්ථික, සංස්කෘතික, සහ දේශපාලනික ක්‍රියාවලියෙන් ආන්තීකරණය කරනු ලැබ තිබීම හේතු කොට ගෙන ඇය නිරතුරුවම අසාධාරණයට, අයුක්ති සහගතභාවයට සහ අසමාන තත්වයකට ඇද දමා නොසලකා හැර තිබේ. මෙම තත්වය නිවසෙහි, සමාජය හා ප්‍රජාව තුළද, වැඩබිමේදී, දේශපාලන තලයේදී යන සෑම ක්ෂේත්‍රයක් තුළම පැතිර පවතී. ස්ත්‍රීන්ගේ භූමිකා පුළුල් වී ඇති බවක් මතුපිටින් පෙනී ගියද, එයින් ස්ත්‍රීන් මත දැරිය නොහැකි පීඩනයන් පටවනු ලැබ තිබේ.

- **ශ්‍රමය ස්ත්‍රීකරණය වීම තුළින් සමස්ත ජාතික ආර්ථිකයෙහි ප්‍රමුඛ ආදායම් උපයන්නන් බවට ස්ත්‍රීන් පත්වීමත් සමඟම අවදානමට ලක් වූ ශ්‍රමිකයන් බවට පත්වීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගැනීම**
- **සමාජය විසින් ආන්තීකරණයට ලක්කරන ලද සමාජ කොටස්වලටද සමරිසි, සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන්ටද බලපාන බරපතළ හිංසාකාරී සහ පීඩාකාරී තත්වයන් අපි ප්‍රතික්ෂේප කරමු. සියල්ලන්ටම නිදහස සහ සමානාත්මතාව තහවුරු වූ, හිංසනයෙන් හා පීඩාවන්ගෙන් තොරව ජීවත් විය හැකි සමාජයක් නිර්මාණය කිරීම**
- **ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත අසාධාරණ ලෙස සහ අසමාන ලෙස සලකන නීති ප්‍රතිසංස්කරණය කිරීම**
- **ස්ත්‍රීන්ගේ දේශපාලනික නියෝජනය, සහභාගිත්වය, හා භූමිකාව ප්‍රධාන ධාරාවට එක් කිරීම**

**ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත අසාධාරණ ලෙස සහ අසමාන ලෙස සලකන නීති ප්‍රතිසංස්කරණය කිරීම**

- ආයතනගත හිංසන ව්‍යුහයන් ඇතුළුව සියලු ආකාරයේ හිංසනයන්ට එරෙහිවීම හා එබඳු හිංසනයන්ට එරෙහි නීති යාවත්කාලීන කිරීම
- අධ්‍යාපනය, ආගම්, ජනමාධ්‍ය යනාදී විවිධ ආයතන විසින් ප්‍රතිනිෂ්පාදනය කොට පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ඒකාකෘතීන්ගේ අගතිගාමී ස්වරූපයන්ට එරෙහිවීම සහ විකල්ප මතවාද ගොඩනැංවීම සහ ස්ත්‍රීන් සහ පුරුෂයින් විසින් කරපින්නාගෙන යනු ලබන අගතිගාමී සහ ගතානුගතික විශ්වාස, ආකල්ප සහ මිත්‍යා මතයන්හි වාහකයින් වීම වැළැක්වීමට අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම





අධ්‍යාපනය, ආගම්, ජනමාධ්‍ය යනාදී විවිධ ආයතන විසින් ප්‍රතිනිෂ්පාදනය කොට පවත්වාගෙන යනු ලබන ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ඒකාකෘතීන්ගේ අගතිගාමී ස්වරූපයන්ට එරෙහිවීම

# ළමුන් හා තරුණයන්

- ළමා ආරක්ෂණය වෙනුවෙන් ඇති ආයතන පද්ධතිය එනම් අධිකරණය, පරිවාසය, සමාජ සේවා, ළමා ආරක්ෂක අධිකාරිය අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම
- ශක්තිමත් ළමා ආරක්ෂණ පද්ධතියකට අවශ්‍ය ව්‍යුහාත්මක සහ නෛතික ප්‍රතිසංස්කරණ සිදුකිරීම
- තරුණයන් බලාපොරොත්තු වන සාධාරණය සහ සමානාත්මතාවයට ගරු කරන සමාජයක් බිහි කිරීමට අවශ්‍ය දේශපාලන ආර්ථික සමාජීය වෙනස්කම් ක්‍රියාත්මක කිරීමේදී තරුණයන්ගේ සහභාගිත්වය ප්‍රමුඛකිරීම



**ශක්තිමත් ළමා ආරක්ෂණ පද්ධතියකට අවශ්‍ය ව්‍යුහාත්මක සහ නෛතික ප්‍රතිසංස්කරණ සිදුකිරීම**





# වැඩිහිටියන්

අප රටේ ජනගහනය තුළ වර්ධනය වෙමින් තිබෙන වැඩිහිටි ප්‍රජාවට ආරක්ෂාකාරීව සතුටින් සහ ප්‍රයෝජනවත්ව ජීවත්වීමට අවශ්‍ය සේවාවන් පිහිටුවනු ඇත. ඔවුන් රැකබලා ගැනීම ආණ්ඩුවේ සමාජ වගකීමකි.

# ආබාධිත ප්‍රජාව

ආබාධ සහිත පුද්ගලයන් අනෙකුත් පුරවැසියන්ට හිමි අවස්ථා, වරප්‍රසාද සහ අයිතිවාසිකම් සමව භුක්ති විදීමට ඇති අයිතිය පිළිගනිමින් සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රවාහනය වැනි සේවාවන් සැපයීමේදී ඔවුන්ගේ සුවිශේෂී අවශ්‍යතාවයන් සදහා වීශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

# දේශපාලන ප්‍රතිසංස්කරණ

රාජ්‍යය ප්‍රජාතන්ත්‍රීකරණය නොවීම ශ්‍රී ලංකාව මුහුණදෙන ප්‍රධාන ප්‍රශ්නයකි. එහෙයින් ප්‍රජාතන්ත්‍රවාදය හා මහජන පරමාධිපත්‍යය තහවුරු වූ යහපත් ආණ්ඩුකරණයක් සඳහා පහත සඳහන් ප්‍රතිසංස්කරණ සිදුකරනු ඇත.

- **තනි පුද්ගලයකු මත අන්තනෝමතික ලෙස බලය සංකේන්ද්‍රණය වූ විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට පාර්ලිමේන්තුවට වගකියන කැබිනට් මණ්ඩලයක් සහිත ශක්තිමත් පාර්ලිමේන්තුවක්**
- **රාජ්‍යයේ සහ සන්නද්ධ සේවාවන්හි ප්‍රධානියා ලෙස පාර්ලිමේන්තුවෙන් තෝරා ගන්නා ජනාධිපතිවරයෙක්**
- **ව්‍යවස්ථාදායකය හා විධායකය සහ අධිකරණයේ සංවරණ හා තුලන මූලධර්ම මත පදනම්ව පවත්වාගෙන යන අගමැති ප්‍රමුඛ කැබිනට් ආණ්ඩු ක්‍රමයක්**

අර්බුදය ජය ගැනීමට

**කඩිනම් ප්‍රවේශයක්**

# මහජන නියෝජිතයා

- **ජනාධිපති, අගමැති හා පාර්ලිමේන්තු මන්ත්‍රීන්ට ලබා දී ඇති විශේෂ වරප්‍රසාද අහෝසි කිරීම**
- **මහජන නියෝජිතයින් ලෙස තෝරා පත්වන අයගේ වත්කම් සහ සුදුසුකම් පිළිබඳ තොරතුරුවලට ප්‍රවේශවීමට පුරවැසියා සතු අයිතිය සහ සාවද්‍ය තොරතුරුවලට අභියෝග කිරීමට පුරවැසියා සතු අයිතිය තහවුරු කිරීම**
- **මහජන නියෝජිතයින් ආපසු කැඳවීමේ බලය ජනතාවට**
- **පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පොදු වාහන සංචිතයක්**

**ජනාධිපති, අගමැති හා පාර්ලිමේන්තු මන්ත්‍රීන්ට ලබා දී ඇති විශේෂ වරප්‍රසාද අහෝසි කිරීම**

# ශ්‍රී ලාංකේය ජාතිය

- ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතා නියෝජනය හා සහභාගිත්වය මත පදනම්ව රටේ සියලුම ජාතිකත්වයන්ගේ ශ්‍රී ලාංකේය අනන්‍යතාවය තහවුරු වන දේශපාලනමය හා පරිපාලනමය වශයෙන් බලය විමධ්‍යගත කෙරෙන නව ක්‍රමවේදයක් සහිත පාලන ව්‍යූහයක් හඳුන්වාදීමට කටයුතු කිරීම හා එතෙක් පළාත් සභා විධිමත් හා කාර්යක්ෂම ආයතන බවට පත්කිරීම
- ජාතිකත්වය, ආගම, කුලය, මව් භාෂාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය මත පදනම් කරගෙන කිසිදු පුද්ගලයකු හෝ සමාජ කණ්ඩායමක් නින්දාවට අපහසුතාවයට හෝ වෙනස්කොට සැලකීම වළක්වාලීම සඳහා අධිකරණ බලය සහිත වෙනස්කම් වැළැක්වීමේ කොමිෂන් සභාවක්
- විවිධ ජනකොටස්වල සංස්කෘතික වෙනස්කම් පිළිගනිමින් ඒවා පවත්වාගෙන යාමට, ආරක්ෂා කිරීමට මෙන්ම එම සංස්කෘතික විවිධත්වයන් අතර සහජීවනය වර්ධනය කිරීමට පියවර

# අභිමානවත් හා ස්වාධීන දේශයක්

- ලෝක භූ දේශපාලනයේ සහ කලාපීය බල තුලනයේ යථාර්ථය පිළිගනිමින් ඊට බාධා නොවන ලෙස ගෝලීය දේශපාලනයේ කිසිදු කඳවුරකට පක්ෂග්‍රාහී නොවූ නොබැඳි විදේශ ප්‍රතිපත්තියක්
- ගෝලීය හා දේශීය වශයෙන් පැන නගින සමාජ ආර්ථික ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා අන්‍යෝන්‍ය ගරුත්වය සහ සහජීවනය රැකගනිමින් කටයුතු කිරීමට ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සමඟ සම්බන්ධතාවය



විවිධ ජනකොටස්වල සංස්කෘතික වෙනස්කම් පිළිගනිමින් ඒවා පවත්වාගෙන යාමට, ආරක්ෂා කිරීමට මෙන්ම එම සංස්කෘතික විවිධත්වයන් අතර සහජීවනය වර්ධනය කිරීමට පියවර

# ජාතික ආරක්ෂාව

ජාතික ආරක්ෂාව සහතික වන්නේ මිත්‍රශීලී විදෙස් ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් කිසිදු බල කඳවුරකට ගැති නොවන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් හා ජාතීන් හා ආගමිකයින්ගේ සාධාරණ ඉල්ලීම්වලට ඇහුම්කන් දී එය ඉටුකිරීමෙනි.

- **පුරවැසියන්ගේ නිදහස හා ජීවිත ආරක්ෂාව, ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව, ස්වාධිපත්‍ය සහ අභිමානය ආරක්ෂා කළ හැකි රාජ්‍ය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම**
- **රාජ්‍ය ආරක්ෂාවට එරෙහිව සිදුවන අභ්‍යන්තර යුදමය, දේශපාලනමය, ආර්ථිකමය, සංස්කෘතිකමය තර්ජනයන් සහ අන්තර්ජාතික පීඩනයන්ට මුහුණ දීමට හා ඒවා ජය ගැනීමට අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික යාන්ත්‍රණයක් හා ගැටුම් නිරාකරණ ක්‍රියාවලියක් අඛණ්ඩව පවත්වා ගැනීම**
- **ස්වභාවික ව්‍යසන, වසංගත රෝග සහ සාගත සේම කාර්මික හා පරිසර දූෂණය නිසා ජනතාවගේ ආරක්ෂාවට සිදුවන තර්ජන කල් තබා හඳුනා ගැනීම, ඒවා වැළැක්වීම සඳහා වන යාන්ත්‍රණයන් පිහිටුවීම සහ එවැනි අවස්ථාවලදී පුරවැසියාගේ සිවිල් අයිතීන් ආරක්ෂා කිරීම**
- **විවිධ ජනකොටස් අතර ආගමික හා සංස්කෘතික ගැටුම් වැළැක්වීම සහ ජනතාව අතර සාමය ඇතිකිරීම තුළින් අභ්‍යන්තර සහජීවනය පිළිබඳ ස්ථායීතාවක් තහවුරු කිරීම**
- **තාක්ෂණ තර්ජනයන්ගෙන් ජාතික ආරක්ෂාවට සිදුවන බලපෑම වැළැක්වීම, සයිබර් ආරක්ෂණය පුළුල් කිරීම හා තාක්ෂණ අනතුරු වැළැක්වීම**



පුරවැසියන්ගේ නිදහස හා ජීවිත ආරක්ෂාව, ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව, ස්වාධිපත්‍ය සහ අභිමානය ආරක්ෂා කළ හැකි රාජ්‍ය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

# අධිකරණය

මහජනතාවට කිසිදු සීමාකිරීමකින් හා ප්‍රමාදයකින් තොරව යුක්තිය ඉටුකර ගැනීමේ ක්‍රියාවලියට ප්‍රවිෂ්ඨ වීමට හැකියාව ඇති හා මහජනයාට සමීප, කාර්යක්ෂම සහ ගුණාත්මක අධිකරණ සේවාවක් ඇති කිරීම අපගේ අරමුණයි.

- **අධිකරණ කටයුතුවලට දේශපාලන මැදිහත්වීමකින් තොරව පවත්වාගෙන යාමටත් පත්වීම්, උසස්වීම් ලබාදීම දක්ෂතාව හා සුදුසුකම් මත පමණක් සිදු කිරීමටත් ඉඩකඩ ලැබෙන පරිදි වත්මන් අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීන හා ශක්තිමත් කොට ස්ථාපිත කිරීම**
- **මූලික අයිතිවාසිකම් කඩවූ අවස්ථාවලදී රටේ ඕනෑම පුරවැසියෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීමට හැකි අයුරින් එහි කටයුතු විමධ්‍යගත කෙරෙන අතර ඊට අවශ්‍ය නීතීඥ සහය නොමිලේ ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම**



පසුබසින්නට මීට වඩා අඟලක් හෝ ඉවසා සිටීමට මීට වඩා මොහොතක් අපිට ඉතිරි වී නැත. තවදුරටත් මේ පාරේම ගමන් කිරීමෙන් අනතුරට හෙළන්නේ ඔබේත් මගේත් ජීවිත පමණක් නොව අපේ දුවා දරුවන් ඇතුළු ඉදිරි පරම්පරා ගණනාවකම ඉරණමයි. මේ මොහොතේ අපේ හෘද සාක්ෂිය අවදි කොට අප ඇසිය යුත්තේ මෙම අවාසනාවන්ත ඉරණම අනාගත පරපුරට අත්වීමට ඉඩ නොදී එය වෙනස් කරලීම සඳහා මේ වැරදි සමාජ ආර්ථික ප්‍රතිපත්තිවල ගැඹුරු හා පුළුල් වෙනසක් වෙනුවෙන් අපි පෙනී සිටිය යුතු බව සහ එම වෙනස අත්පත් කර ගැනීමට සමත් දේශපාලන ව්‍යාපාරයක් සමඟ
එකට එකතු විය යුතු බව නොවේද?

ජාතික ජනබලවේගය ලෙස එම ගැඹුරු සහ පුළුල් සමාජ ආර්ථික වෙනස අත්පත් කරගැනීමට අවශ්‍ය අඩිතාලම සඳහා මූලික අදහස් අඩංගු කඩිනම් ප්‍රවේශයක් මෙසේ ඉදිරිපත් කරමු. එම යෝජනා තවදුරටත් පුළුල්කොට ඒවා මේ බිමේ යථාර්ථයක් කරගැනීම සඳහා අප සමඟ අත්වැල් බැඳගන්නා මෙන් ඔබට ආරාධනා කරමු.

# ජාතික ජන බලවේගය

www.npp.lk
nppsrilanka@gmail.com
www.youtube.com/c/NPPSRILANKA